**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2014**

-----------------------------------------------------------------------------------------------------------------

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂපත්‍රයේ හා ආදායම් ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය ව්‍යාචනය**

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-----------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති (ක්ෂය ප්‍රතිපත්තිය හැර) අනාවරණය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.4,723,618 ක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රිසිට්පත් ආදායම රු.8,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) දුරකථන කුළුණු ආදායම මුදල් පදනම යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් කුළුණු 05ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම රු.968,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2014 සැප්තැම්බර් 01 දින සිට වර්ෂ 06 ක කාලයක් සඳහා පෞද්ගලික දුරකථන සමාගමක් සමඟ ඇති කර ගන්නා ලද ගිවිසුම් එකඟතාවය මත ලැබුණු මාසික වාරික හා අත්තිකාරම් මුදල වූ රු.2,080,000 ක්, ආදායම ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.1,813,334 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවන ලද සේවක අර්ථසාධක අරමුදල් දායකය රු.526,660 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සේවක අර්ථ සාධක අරමුදලේ සේවායාගේ දායකය රු.138,144ක් හා සේවක භාරකාර අරමුදල් දායකය රු. 34,536 ක් ආදායම් වියදම් ගිණුමේ වියදමක් ලෙස දක්වා නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් හිඟ දායකය රු.74,254 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) අය නොවූ වැටුප් අත්තිකාරම් රු.49,720 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු.4,501,000 ක් වූ ආදායම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් රිසිට්පත්, ආදායම් ලේඛණ හා වලංගු බදු ගිවිසුම් ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) එකතු වටිනාකම රු.347,479,500 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ලෙජර් ගිණුම්, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබූ බැවින් විගණනයේදී නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) ජංගම නොවන වගකීම් රු.347,526,326 ක් සම්බන්ධයෙන් ලෙජර් ගිණුම් හා උපලේඛන පවත්වා නොතිබීමෙන් එහි නිවැරදිතාවය හා පැවැත්ම තහවුරු කරගත නොහැකි විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල පනත | |
| | 3 (2) වගන්තිය | භාරකාරීත්ව මණ්ඩලය සඳහා වගන්තියේ සඳහන් සාමාජිකයන් පත් කර නොතිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තියේ 2 වන උපවගන්තිය | මාසයෙහි අවසාන දිනට හෝ එදිනට පෙර අදාළ දායක මුදල් අරමුදල වෙත ගෙවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අයකරගන්නා ලද රු.231,400 ක දායක මුදල නියමිත දිනට අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | i. මුදල් රෙගුලාසි 395 (ඇ) | එක් එක් මාසය අවසානයේ බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| | ii. මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පීඑෆ්/423 හා 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | |
| | 4.3 වගන්තිය | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සමුච්චිත අරමුදලේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | අමාත්‍යාංශය මගින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵලය**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.430,211 ක අතිරික්තයත් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,928,833 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,359,044 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**3.2** **ආදායම් පරිපාලනය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රුපියල් මිලියන.10.5 ක වියදමක් දරා ඉදිකළ සංචාරක බංගලා 2 ක් අරමුදල සතුව පැවතිය ද, සමාලෝචිත වර්ෂයේ ආදායම රු.25,000 ක් විය. දර්ශනීය වටපිටාවක පිහිටි මෙම සංචාරක බංගලා දෙක සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දී සංචාරක ආකර්ෂණය ඇති කර ගැනීම තුලින් එහි ආදායම ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රුපියල් මිලියන 10.0 ක වියදමක් දරා නිම කරන ලද සම්මන්ත්‍රණ ශාලාවක් අරමුදල සතුව පැවතියද සමාලෝචිත වර්ෂය තුළදී එකදු සම්මන්ත්‍රණයක් හෝ පවත්වා ආදායමක් ඉපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ ii කොටසේ 8 වගන්තිය අනුව භාර අරමුදලේ සේවය කරන සියලුම සේවකයින් සඳහා දායක මුදල් ගෙවීමට ආයතනය බැඳී සිටියද, සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් තිදෙනෙකුගෙන් දායක මුදල් අයකර නොතිබුණි.

**4.2** **හඳුනාගත් පාඩු**

----------------

සමාලෝචිත වර්ෂයේ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් 2013 වර්ෂයේ දායක මුදල ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් රු.42,204 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

**4.3** **කාර්ය සාධනය**

----------------

අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2009 අංක 44 දරන පනතේ 4 වගන්තියේ (අ) සිට (ත) දක්වා වූ අරමුණු 20 න් අරමුණු 4 ක් හැරුණු විට අනෙකුත් අරමුණු ඉටුකිරීම සඳහා අරමුදල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

## 5.1 නොවිසඳුන විගණන ඡේද

----------------------------

මහා භාරකාරවරයා විසින් පවත්වාගෙන යනු ලබන ලෙජරය අනුව අම්බුළුවාව භාර අරමුදල වෙනුවෙන් ඉකුත් වර්ෂවල මුලධන වියදම් සඳහා රු.2,600,000 ක මුදලක් දරා තිබුණ ද එම වියදම් හඳුනාගෙන අරමුදල විසින් ගැලපීම් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් පරිපාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) තොග පාලනය
(ඈ) වත්කම් පරිපාලනය